දුරකථන/ தொலைபேசி/ Telephone Nos.
අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784832
ලේකම් / செயலாளர் / Secretery } 2784811
කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50 Fax-2784846
ඊ-තැපැල්/மின்னஞ்சல்/E-mail- isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education
'ඉසුරුපාය', ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, බත්තරමුල්ල.
'இசுறுபாய', ஸ்ரீ ஜயவர்த்தனபுர கோட்டை, பத்தரமுல்லை.
'Isurupaya', Sri Jayawardanapura Kotte, Baththaramulla.

ඔබේ අංකය / உமது இல. / Your No } ........................................

මගේ අංකය / எமது இல. / My No } ED/09/96/04/7

දිනය / திகதி / Date } 2017-11-27

චක්‍රලේඛ අංකය -39/2017

සියළුම විදුහල්පතිවරුන්,

## පාසල් පුස්තකාල පොත් / ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා වන නිර්ණායක -2017

ප්‍රධාන කරුණු 03 ක් යටතේ පොත්වල ගුණාත්මකභාවය තීරණය කිරීම අපේක්ෂා කෙරේ.

01. අන්තර්ගතයේ ගුණාත්මකභාවය
02. භාෂා භාවිතයේ නිරවද්‍යතාවය
03. නිෂ්පාදනයේ ගුණාත්මකභාවය

### 01.අන්තර්ගතයේ ගුණාත්මකභාවය

අන්තර්ගතයේ ගුණාත්මකභාවය තීරණය කිරීමේ දී පහත සඳහන් නිර්ණායක කෙරෙහි සැලකිලිමත් විය යුතුය.

i. ළමුන්ගේ වයසට හා දැනුම් මට්ටම්වලට ගැලපෙන ලෙස කියවීමට පහසු හා සරල භාෂාවෙන් ලියැවී ඇති කියවීම් රුචිය වැඩි කරන පොත් වීම.
ii. ළමා වයස් මට්ටම්වලට ගැලපෙන පරිදි, තොරතුරු ලබාගත හැකි ලෙස සංස්කරණය වී ඇති පොත්පත් වීම.
iii. සම්මත සාරධර්මවලට සහ අධ්‍යාපන හා ජාතික අරමුණුවලට අනුකූල පොත් වීම. (ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සිත් දූෂ්‍ය කිරීමට තුඩු දෙන ආකාරයේ අදහස්, මතිමතාන්තර හා කරුණු ඇතුළත් නොවීම.)
iv. ළමයින්ගේ මානසික වර්ධනයට හිතකර කරුණු, චිත්‍ර, ඡායාරූප ඇතුළත් වීම.
v. කිසියම් ආගමක්, ජාතියක්, ජන කොට්ඨාසයක් හෝ සමාජ සංස්ථාවක් ගර්හාවට, අපහාසයට, අවප්‍රමාණයට හා හාස්‍යයට ලක් කෙරෙන හෝ ඔවුන් අතර භේද ඇති කිරීමට, ගැටුම් ඇති කිරීමට, වෛරවාදී හැඟීම් ඇති කිරීමට තුඩු දෙන ආකාරයේ කිසියම් අදහසක්, මතිමතාන්තරයක්, කරුණක් හෝ චිත්‍රයක් ඇතුළත් නොවීම.

- විෂය මාලාවට ආශ්‍රිත ග්‍රන්ථ තේරීමේදී පහත සඳහන් විශේෂ නිර්ණායක ද සම්පූර්ණ විය යුතුය.
  i. අදාළ විෂයට අනුකූල වීම.
  ii. ඇතුළත් කරුණු යාවත්කාලීන වීම.
  iii. පිළිගත් මනෝවිද්‍යාත්මක හා අධ්‍යාපන සිද්ධාන්තවලට අනුකූලව පිළියෙල කර තිබීම.

iv. පාරිභාෂික වචනවල නිවරද්‍යතාවය.

v. ප්‍රශ්නෝත්තර සංග්‍රහ හා වැඩ පොත් ඇතුළත් නොවිය යුතුය. (අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ මුද්‍රිත පොත් හැර)

vi. පොතේ අන්තර්ගත කරුණුවලට අදාළ වන පරිදි රූපන සටහන් ඇතුළත් කොට තිබීම.

## 02. භාෂා භාවිතයේ නිරවද්‍යතාව

i. ඉදිරිපත් කර ඇති කරුණු නිවැරදිව, පැහැදිලිව හා තේරුම් ගත හැකි බස් වහරක් භාවිතා කර තිබීම.

ii. සම්මත භාෂා රීතියට අනුකූල විය යුතු අතර, මුළු කෘතිය පුරාම භාෂා භාවිතයෙහි සමරූපීතාවක් තිබීම.

iii. අක්ෂර වින්‍යාස දෝෂ, මුද්‍රණ දෝෂ හා නිෂ්පාදන දෝෂවලින් තොර වීම සහ වචන වෙන් කිරීම, විරාම ලක්ෂණ යෙදීම, නිවැරදි හා දෝෂ නොමැති වීම.

## 03. නිෂ්පාදනයේ ගුණාත්මකභාවය

- පොත් පත්

නිෂ්පාදනයේ ගුණාත්මකභාවය තීරණය කිරීමේදී පහත සඳහන් නිර්ණායක සියල්ලම සපුරා තිබිය යුතුයැයි අදහස් කෙරේ.

i. ISBN (අංකය) තිබීම.

ii. 2010 වසරට පසුව නිකුත් වූ නව ප්‍රකාශන හෝ සංස්කරණ හෝ මුද්‍රණ වීම. (මෙය සම්භාව්‍ය කෘති, විශ්ව සාහිත්‍ය කෘති, නිර්දේශිත කෘති සඳහා අදාළ නොවේ)

iii. පොත් බැම්ම Section Binding හෝ Perfect Binding හෝ center Wiring වීම. (පිටු 32 ට අඩු පොත් හැර)

iv. පොතෙහි මිල මුද්‍රණය කර තිබීම. (මිල සඳහන් ස්ටිකර් ඇලවීම, රබර් මුද්‍රා තැබීම පිළිනොගත යුතුය) ආනයනික පොත් සඳහා පමණක් නිල ලත් ආනයනකරුගේ අනන්‍යතාව සහිත මුද්‍රාවක් තැබීම පිළිගත හැකිය.

v. සාමාන්‍ය පොතක පිටු සංඛ්‍යාව 49 හෝ ඊට වැඩි විය යුතුය. එහෙත් ප්‍රාථමික පන්ති සඳහා ලියන ලද පොතක පිටු සංඛ්‍යාව 16 ක් හෝ ඊට වඩා වැඩි වීම. (විෂය කරුණු හෝ කථාව ඇතුළත් පිටු සංඛ්‍යාව)

vi. පොතේ ප්‍රමාණය ක්‍රවුන් 1/8 හෙවත් 180 mm x 120 mm හෙවත් 7x5 ප්‍රමාණය හෝ ඊට වඩා වැඩි වීම.

vii. ජී.එස්.එම්. 70 හෝ 80 අදාළ බරකින් යුතු පොත් මුද්‍රණය සඳහා සුදුසු කඩදාසියක මුද්‍රණය කර තිබීම.

viii. කඩදාසි බෝඩ් කවරයක් යෙදීමේ දී ඒ සඳහා සුදු ජී.එස්.එම්.200 හෝ ඊට වැඩි කඩදාසි බෝඩ් භාවිතා කිරීම.

ix. ඇතුළත පිටු පැහැදිලි ව (තීන්ත බොඳ නොවී ක්‍රමවත්ව) මුද්‍රණය වී තිබීම.

x. පොතට ගැළපෙන ආකාරයට, කියවීමට පහසු වන පරිදි, හතර පැත්තේ හිස් තීරු මිලි මීටර 15 හෝ ඊට වැඩිව තිබීම. (මුද්‍රිත අකුරු සඳහා පමණි.)

xi. News print (පත්තර මුද්‍රණය කරනු ලබන) කඩදාසි භාවිතා කර ඇති පොත් තෝරා ගැනීමෙන් වැලකිය යුතුය.

xii. මුල් පිටු හා අන්තර්ගත පිටු කිසියම් සම්මත ආකාරයකට අංකනය කර නියමිත පරිදි ගොනුකර තිබීම.

xiii. චිත්‍ර රූප සටහන් හා අකුරු ආකර්ෂණීයව, අර්ථවත්ව හා පැහැදිලිව තිබිය යුතු අතර, ඒවා නම්කර තිබීම.

xiv. චිත්‍ර හා රූප සටහන් සිසුන්ගේ වයස් මට්ටම් අනුව සුදුසු වීම.

xv. අනුමැතිය ලද පොත් සහ පුස්තකාල කමිටුවේ අනුමැතිය ලද පොත් සඳහා ඉහත සියළු කරුණු අදාළ නොවිය හැකිය.

**04. මිලදී ගන්නා පිළිවෙළ**

I. ප්‍රාථමික අංශය සඳහා මිලදී ගනු ලබන කථා පොත් චතුර් වර්ණයෙන් (Four Colours) වීම. (පාසලට අත්‍යාවශ්‍ය බවට හැඟෙන පොත් පමණක් ද්වි වර්ණ (two colours) වුව ද මිලදී ගැනීම කළ හැකිය.)

II. ප්‍රාථමික අංශ පොත් මිලදී ගැනීමේ දී පින්තූර සහ අකුරුවල ප්‍රමාණය ගැන සැලකිලිමත්ව මිලදී ගැනීම.

III. පොත් මිලදී ගැනීමේ දී අවම වශයෙන් ප්‍රකාශකයන් 15කගේ හා කර්තෘ ප්‍රකාශකයින් 10 කගේ වත් පොත් ඇතුළත් වන පරිදි පොත් ලයිස්තු සකසා මිලදී ගැනීම කළ යුතුය.

IV. පාසල් විෂය මාලාවට කෙළින්ම අදාළ පොත් සහ අමතර දැනුම සඳහා කියවීමට සුදුසු පොත් වටිනාකමින් 60% ක් ලෙස මිලදී ගැනීම.

V. සාහිත්‍ය නිර්මාණ හෝ රසවින්දනයට අදාළ පොත් 40% ක් ලෙස මිලදී ගැනීම.

VI. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ හෝ වෙනත් රාජ්‍ය හා රාජ්‍ය අනුබද්ධ ආයතන මගින් ප්‍රකාශයට පත් කරන පොත් මිලදී ගැනීම සඳහා ඉහත සියළු නිර්ණායක තිබීම අත්‍යාවශ්‍ය නොවේ.

VII. ප්‍රාථමික, 6, 7, 8, 9, 10, අ.පො.ස. (සා.පෙළ.) ,අ.පො.ස. (උ.පෙළ) යන සියළුම මට්ටම්වල විෂයයන් නියෝජනය වන පරිදි පොත් මිලදී ගැනීම.

VIII. ආනයනික පොත් පත් මිලදී ගැනීමේ දී ඒ ඒ රටවල ප්‍රමිති සහතිකයක් ඇති පොත් මිලදී ගැනීමට කටයුතු කිරීම.

IX. පොත් මිලදී ගන්නා ආයතනවල පහසුව සඳහා 2017 වසරේ සිට පාසල් පුස්තකාල සඳහා අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලයේ අනුමැතිය ලද පොත් නාමාවලියක් සකස් කර ප්‍රසිද්ධ කර ඇත.. මෙම පොත් ලයිස්තුව අධ්‍යාපන අමාත්‍යාංශ වෙබ් අඩවියට ද (www.moe.gov.lk) ඇතුළත් කර ඇත.

X. පොත් නාමාවලියේ ඇතුළත් නොවන එහෙත් පාසල් සිසුන්ට ප්‍රයෝජනවත් හා අත්‍යාවශ්‍ය පොතක් /පොත් වේ නම් පාසල් පුස්තකාල කමිටුවේ අනුමැතිය මත තෝරා ගෙන මිලදී ගැනීම කළ හැකිය. මෙසේ මිලදී ගන්නා පොත් ප්‍රමාණය ලබා දී ඇති අරමුදලින් 15% නො ඉක්ම විය යුතුය.

XI. එම පොත් නාමාවලියේ ඇතුළත් පොත් අතුරින්, පාසලේ පුස්තකාල පොත් තේරීමේ හා මිලදී ගැනීමට බලය ලත් කමිටුවක අභිමතය පරිදි පාසල් ප්‍රජාවගේ අවශ්‍යතාවය මත එම පොත් අතුරින් අවශ්‍ය පිටපත් සංඛ්‍යාවක් මිලදී ගත හැකිය.

XII. පොත් මිලදී ගැනීමේදී අවශ්‍ය අවම වට්ටම පහත සඳහන් පරිදි වේ.

- දේශීය ප්‍රකාශන සඳහා (සිංහල සහ ඉංග්‍රීසි) 25%
- දේශීය දෙමළ පොත් සඳහා 15%
- ආනයනික පොත් සඳහා 15%

සුනිල් හෙට්ටිආරච්චි
අධ්‍යාපන ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් -

1. පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
2. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
3. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්